වගා සහනාධාර චක්‍රලේඛ අංක.42

සුළු තේ වතු සංවර්ධන අධිකාරිය
අංක. 349, ගාලු පාර,
කොළඹ 03.
1994.05.27 දින.

ප්‍රාදේශීය කළමනාකරු මගින්,
කාර්යාල හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය වෙත.

## තේ වගා කිරීමේ සහනාධාර ක්‍රමය - නැවත වගාව/අළුත් වගාව.

තේ පාලන පනතේ විධිවිධාන අනුව තේ වගා කිරීම සඳහා අවසර පත්‍රයක් ලබාගත යුතු බවට කර ඇති නියමය දැනට ඉවත්කර තිබෙන බැවින් මින් ඉදිරියට තේ වගා කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේ අවශ්‍යතාවයක් නැත.

2. එබැවින් මින් ඉදිරියට තේ නැවත වගා/අළුත් වගා සහනාධාර ක්‍රම යටතේ, නිර්දේශිත බිම් ප්‍රමාණය වගා කිරීමට අනුමැතිය දෙමින් තේ වගාව සඳහා අදාල වන කොන්දේසි සඳහන් කර ඒ අනුව කටයුතු කිරීමට ඉඩම් හිමියගේ එකඟත්වය ප්‍රකාශ කරවා ගැනීම ප්‍රමාණවත් වේ. පැළ වගා සහනාධාර ක්‍රමය දැනටමත් මේ අනුව ක්‍රියාත්මක වේ.

3. මේ සඳහා දැනට භාවිතා කරන එස්.පී./ආර්.පී.6 ඩී. දරණ ආකෘතිය පහත සඳහන් අයුරු සරල ආකාරයට සංශෝධනය කරමින් ඒ සඳහා යොදාගත යුතු බව සලකන්න.

I. අවසර පත්‍ර අංකය යන්න වෙනුවට 'යොමු අංකය' යනුවෙන් වෙනස්කර පළමු ඡේදයේ අවසානය, 'ඔබගේ තේ යෝජිත නැවත වගා කිරීමට / අළුතින් වගා කිරීමට මෙයින් අනුමත කරනු ලැබේ.' යනුවෙන් වෙනස් කිරීම හා 'මෙම අනුමැතියේ කාලය ..................දිනෙන් අවසන් වේ' යනුවෙන් සඳහන් කිරීම.

II. අංක 3 සිට 6 දක්වා ඡේදවල 'අවසර පත්‍රය' හා 'අවසර දෙන ලද' යනුවෙන් සඳහන් ස්ථාන 'අනුමැතිය' හා 'අනුමැතිය දෙන ලද' යනුවෙන් වෙනස් කිරීම.

4. ප්‍රාදේශීය කාර්යාල හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් සම්බන්ධයෙන් දැනුවත් කළයුතු අතර, මෙම චක්‍රලේඛය ලද බව දන්වා එවීමද කැමැති.

(ජයන්ත කරුණාතිලක)
සභාපති.

පිටපත:-
ව්‍යාපෘති නිලධාරී,
කෑගල්ල / කළුතර.